(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 1(7).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2019 පෙබරවාරි 01 වැනි සිකුරාදා

## 2019 පෙබරවාරි 20 වැනි බදාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාවක් ලබා ඇති පක්ෂය වශයෙන් එක්සත් ජාතික පක්ෂය විසින් ජාතික ආණ්ඩුවක් පිහිටුවා ඇති බැවින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(4) ව්‍යවස්ථාව ප්‍රකාර අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාව 48ක් නොඉක්මවිය යුතු අතර, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාව 45ක් නොඉක්මවිය යුතු බවට මෙම පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබයි.

*

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156(3) ව්‍යවස්ථාව සහ 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනතේ 3(4) වගන්තිය ප්‍රකාරව, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ (ඔම්බුඩ්ස්මන්) වැටුප පාර්ලිමේන්තුව විසින් නිශ්චය කළ යුතු හෙයින් ද;

ඒ අනුව, 2018.06.01 දින සිට පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ (ඔම්බුඩ්ස්මන්) මාසික වැටුප රු.135,000.00 ලෙස ද, මාසික දුරකථන දීමනාව රු.10,000.00 හා මාසික ඉන්ධන දීමනාව ලීටර් 225ක් ලෙස ද ප්‍රතිශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා දී ඇති හෙයින් ද;

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156(3) ව්‍යවස්ථාව හා 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනතේ 3(4) වගන්තිය ප්‍රකාරව, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ (ඔම්බුඩ්ස්මන්) ඉහත සඳහන් පරිදි මාසික වැටුප හා දීමනා ප්‍රතිශෝධනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*